උඩුබද්දාව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලී බඩු හා සවිකිරීම් යටතේ පොත් අගය රු.145,000/- ක් වූ යතුරු ලියන, කසල කරත්ත, රෝනියෝ යන්ත්‍ර හා ජල පොම්ප යනාදියෙහි වටිනාකම්ද ඇතුලත්ව පැවති අතර ජර්නල් සටහන් අංක 103 මගින් වියලි ඖෂධ මිලදී ගැනීම සඳහා දරන ලද වියදම් රු.300,000 ක වියදම්ද ප්‍රාග්ධන වියදම්වලට මාරු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට තථ්‍ය සේවක ණය ශේෂය රු.6,144,634 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,675,440 ක් ලෙස රු.1,469,194 ක් අඩුවෙන් ගෙන තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂ යටතේ ගිණුම් විෂයයන් 06 කට අදාලව ගිණුම අනුව සහ අදාල උපයෝගී ලේඛන අතර රු. 819,566 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 30,648,782 ක් විය. ඉන් ආසන්න වශයෙන් සියයට 1.6 ලෙස රු. 482,538 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.15,164,407 ක් විය. ඉන් ආසන්න වශයෙන් සියයට 5.1 ක් ලෙස රු.781,371 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 1,604,104 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.6,475,444 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.7,046,158 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.570,714 ක පිරිහීමක් පැවතුණි.මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.16,525,439 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.17,462,156 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.5,538,727 ක අතිරික්තයක් බවට පත්ව ඇත.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.49,378,606 න් ආසන්න වශයෙන් සියයට 71.9 ක් ලෙස රු.35,549,373 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.16,525,439 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.42,903,162 න් ආසන්න වශයෙන් සියයට 68.33 ක් ලෙස රු 29,313,960 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් ආසන්න වශයෙන් සියයට 77.67 ක් ලෙස රු.22,768,648 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.17,462,156න් ආසන්න වශයෙන් සියයට 41.80 ක් ලෙස රු.7,299,750 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබුණු අතර ආසන්න වශයෙන් ඉතිරි සියයට 58.20 ක්වූ රු.10,162,406 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදනවලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 බදු කුලී

අවම ලංසුව රු.263,988 ක් වූ මස්කඩ 06 ක් ද අවම ලංසුව රු.39,545 ක් වූ මාලුකඩ 07 ක් හා අවම ලංසුව රු. 27,106 ක්ද වූ පොල් එළදා 06 ක් සමාලෝචිත වර්ෂයට අදාලව බදු දීමට නොහැකි වී තිබුණි.

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.193,373 ක් වූ අතර මුද්දර ගාස්තු ප්‍රමාණය රු.14,059,304 ක් විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කට්ටිමහන ඌරු මස් කඩය බදු දීම වෙනුවෙන් අය විය යුතු රු.123,810 ක් අය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා අතිරේක පිරිවැයක් දරමින් නඩු පැවරීමට සිදු වී ඇත.

(ආ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 82 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 90 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ අතිරික්තය 8 ක්ව පැවතුණි. එය තනතුරු නාම 5 ක් යටතේ අතිරික්ත 17 ක්ද තනතුරු නාම 07 ක් යටතේ ඌනතා 09 ක්ද වශයෙන් විය.

3.2 <u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

(අ) 2014 වර්ෂය තුල ලැබුණු රු. 10,178,880 ක් වටිනා වාහන දෙකක් සඳහා ලියාපදිංචි රක්ෂණ සහතික හා ආදායම් බලපත්‍ර 2015 මැයි මස වන විටත් ලබා නොගැනීම නිසා ධාවනයට නොයොදවා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2012 මාර්තු මස නිෂ්පාදන කටයුතු ආරම්භ කල සභාවේ කුට්ටිගල් ව්‍යාපෘතියෙහි නිෂ්පාදන කටයුතු 2013 දෙසැම්බර් 12 දිනෙන් පසු නවතා දමා තිබුණි. ඒ හේතුවෙන් ඊට අදාල යන්ත්‍ර හා ගොඩනැගිලි ප්‍රයෝජනයට ගෙන නොතිබු බව 2014 ඔක්තෝබර් 18 දින සිදු කල භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). මූල්‍ය පාලනය
(ඇ). ආදායම් පරිපාලනය